# 2025.06.13 දින විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව

සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව
විශේෂ මාසික මහ සභා රැස්වීම් වාර්තාව
ස්ථානය :- සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය
දිනය :- 2025. ජුනි මස 13
වේලාව :- පෙ.ව.9.00.

<u>සහභාගීත්වය</u>

| | |
|---|---|
| 01. ඩබ්.වී. සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමා | - ගරු සභාපති |
| 02. පී.කේ. අසංක ඉදුනිල් මැතිතුමා | - ගරු උප සභාපති |
| 03. ජී.එම්. සුනිල් ප්‍රේමරත්න මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. ඩී.එම්. කමල් ගුණරත්න මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05. ටී.ඩබ්. උපාලි වසන්ත කුමාර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06. ජී. ශානිකා ප්‍රියදර්ශනි මැතිණිය | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී |
| 07. කේ.එම්.ධර්මදාස බණ්ඩාර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 08. ආර්.එම්. අජිත් කුමාර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 09. කේ.එම්. අජිත් පුෂ්ප නන්දන මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. කේ.ආර්.එම්. අමරවංශ මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 11. එල්.එච්.හර්ෂනි මධුමාලී මැතිණිය | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී |
| 12. බී.බී.සිරිත් ප්‍රියදර්ශන පෙරේරා මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13. ඩබ්.ඒ. පුෂ්පජිත් මධුසංඛ අමරසිංහ මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. එච්.එම්. මහේෂ් ඉන්දික බණ්ඩාර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. එම්.ඒ. චාන්දන බණ්ඩාර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. ආර්. එම්. අබේපාල මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 17. කේ.එම්.වසන්ත රංජිත් කුමාර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18. ඩී.එම්. මධුරාණි දිසානායක මැතිණිය | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී |
| 19. ආර්.එම්. හේමලතා මැණිකේ මැතිණිය | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී |
| 20. එල් .එල්. සුජිත් කුමාර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී |
| 21. ආර්.එම්. ඉන්ද්‍රාවති මැතිණිය | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී |

# 2025.06.13 දින විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව

2025 මැයි මස 06 දින පැවැති පළාත් පාලන මැතිවරණයෙන් සියඹලාණ්ඩුව ප්‍රාදේශිය සභාවට අභිනවයෙන් තේරිපත්වූ ගරු මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා 21 දෙනෙනකුගේ සහභාගිත්වයෙන් 2025.06.13 වන දින පෙරවරු 9.30ට පළමු විශේෂ මහ සභා රැස්වීම ගරු සභාපතිතුමාගේ මූලිකත්වයෙන් පවත්වන ලදි. ඒ අනුව මෙදින පැවැති විශේෂ මහා සභා රැස්වීමේ මූලික කටයුතු ආරම්භ කිරිමට පෙර ජාතික කොඩිය එසවීමේ චාරිත්‍රයට පසු ආගමික වතාවත් සිදු කර රැස්වීම ආරම්භ කරන ලදි. මුලින්ම ගරු සභාපතිතුමා විසින් පළමුව පැමිණ සිටි සියලුම සභිකවරුන් හා මාධ්‍යවේදීන්ද කාර්ය මණ්ඩලයද පිළිගන්නා ලද අතර ඉන්පසු න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු මෙහෙයවන ලදි.ඉන් අනතුරුව සභාපතිතුමා විසින් සභාවේ අසුන් ගැන්වීම සහ නෛතික කටයුතු සිදු කිරිම සම්බන්ධයෙන් නිතිමය තත්වය පිළිබඳ හැදින්වීමක් සිදු කරන ලෙස සභා ලේකම් වෙත ආරාධනා කරන ලදි. ඒ අනුව සභාලේකම් තුමා විසින් ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට සුභාශිංසන පිරිනමමින් තම කථාව ආරම්භ කරන ලදි. ගරු සභාපතිතුමණි, හත්වන සභාවාරයේ මංගල සැසිය ආරම්භ කරනවා. මෙම ධුරධාරින් පත් කිරිම මැතිවරණ කොමසාරිස් විසින් නිකුත් කළ අංක 2438/87 2025 මැයි මස 31 වැනි සෙනසුරාදා දරණ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කර තිබූ අතර ගරු සභාපති සහ උප සභාපති පත් කිරිම මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ අංක 2438/92 2025 මැයි මස 31 වැනි සෙනසුරාදා ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර තිබුණි. ආසන පැනවීම අද දින ගරු සභාපතිතුමා මූලාසනය ගන්නා අතර, සභාපතිතුමාගේ දක්ෂිණාවර්ථව ගරු උප සභාපතිතුමා, ජේෂ්ඨත්වය අනුව සභිකයින් අසුන් ගැනිමේ හැකියාව තිබෙනවා. එමෙන්ම තවත් මන්ත්‍රීවරුන් පැමිණිමට නියමිතව තිබෙනවා. ඔවුන් තාම නම් ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරගන්නා තෙක් අභිමතය පරිදි අසුන් ගන්නා ලෙසත්, ඒ වගේම ගරු සභාපතිතුමාට සභාවේ පූර්ණ වගකිම් හා සියලු බලතල හිමිවෙනවා. එතුමා ගේ අභිමතය, නියෝගය පරිදි සියලු කටයුතු සිදු විමට නියමිතයි. 1988 ප්‍රදේශිය සභා මුල්‍ය හා පරිපාලන රිති අනුව සියලුම වවුචර් සහතික කිරිම (රිති 99) ගරු සභාපතිවරයාට පැවරෙන බවත්, වවුචර්වල ගෙවීම් අනුමත කිරිම සහා ලේකම් වෙත පැවරිම සිදු කරන බවත් සභා ලේකම්වරයා විසින් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව මෙම බලතල ඒ අයුරින්ම සභාපතිතුමා වෙතත් සභා ලේකම්වරයා වෙතත් පවරා දිම සුදුසු බවත් සභාව ඒකමතිකව සම්මත කරන ලදි.

ඉන්පසු ගරු සභාපතිතුමා විශේෂ සභා රැස්වීමේ අරමුණ පැහැදිලි කිරිමෙන් අනතුරුව පළමු කොට ඉදිරි මාස 06 සඳහා ප්‍රාදේශිය සභාවේ මහා සභා පවත්වන දින තිරණය කරන ලදි. ඉදිරියට සෑම මාසයකම අවසන් සතියේ සිකුරාදා දින පෙ.ව. 9.00 ට සභාව පැවැත්වීම සුදුසු බවට ගරු උපසභාපති පී.කේ. අසංක ඉඳුනිල් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී කේ.ආර්.එම්. අමරවංශ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි. එලෙසම සෑම මසකම අවසාන සිකුරාදා දින යම් රජයේ නිවාඩු දිනයක් යෙදි තිබුණහොත් ඊට පෙර බ්‍රහස්පතින්දා දින ඒ සඳහා යොදා ගැනිම සුදුසු බවටද තිරණය කරන ලදි. මේ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් සභාවේ අදහස් විමසා සිටින ලදි. ඒ අනුව මෙම දින තෝරා ගැනිම සම්බන්ධව කිසිවකුගේ විරෝධතාවයක් නොවූ බැවින් සියලු දෙනාගේ ඒකමතික එකඟතාවය මත එම දිනය තිරණය කරන ලදි. ඉන් අනතුරුව ඉදිරිපත් වුයේ 1987 අංක 15 දරණ පනතේ 12(2) වගන්ති ප්‍රකාරව එක් එක් කාරක සභා සඳහා සාමාජිකයින් තෝරාපත් කර ගැනිමයි. තවද එම කාරක සභා වශයෙන්

01. **මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව**
02. **නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව**
03. **පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාව**
04. **කාර්මික සේවා පිළිබඳ කාරක සභාව**

යන කාරක සභා වෙත ඊට අදාල සමස්ත බලතල මහා සභාවෙන් ලබාදීම පිළිබඳව 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 216 වගන්තියෙන් දක්වා ඇති බලතල පනතේ දැක්වෙන ආකාරයෙන් නිලධාරින් වෙත පවරා දීමටද යන යෝජනාව ගරු සභාපතිවරයා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු අප සභාපති අසංක ඉඳුනිල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.එය සභාව් සාකච්ඡාවට බඳුන් කල අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2025.06.13 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එම බලතල එලෙසින් ක්‍රියාත්මක කිරිම සුදුසු බව මහ සභාව ඒකමතිකව තිරණය කරන ලදි.

ඉන් අනතුරුව එක් එක් කාරක සභා සහ එහි සාමාජිකයින් පත් කිරිමට ගරු සභාපතිතුමා විසින් අවස්ථාව ලබා දෙන ලදි. මුලින්ම මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව සඳහා ගරු සභාපතිතුමා නිලබලයෙන් පත්වන බවත් ,අනෙකුත් සමාජිකයින් ලෙස පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා සහ පිටස්තර පාර්ශවයෙන් පුද්ගලයින් දෙදෙනෙක්ද යෝජනා කරන බව ගරු ජේ.ශානිකා ප්‍රියදර්ශනි මන්ත්‍රීතුමිය ප්‍රකාශ කරන ලදි.

**01. මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව**

01. ගරු සභාපති ඩබ්.වී සුසන්ත ප්‍රදිප් කුමාර මැතිතුමා - සභාපති
02. ගරු උපසභාපති පී.කේ අසංක ඉඳුනිල් මැතිතුමා - සාමාජික
03. ගරුමන්ත්‍රී කේ.ආර්.එම්.අමරවංශ මැතිතුමා - සාමාජික
04. ගරු මන්ත්‍රී කේ.එම් ධර්මදාස බණ්ඩාර මැතිතුමා - සාමාජික
05. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී මධුෂංක අමරසිංහ මැතිතුමා - සාමාජික
06. ජේ.පී නිශාන්ත මහතා - සාමාජික
07. පී.එම් සුදු අප්පු මහතා - සාමාජික

ගරු මන්ත්‍රී ටි.ඩබ්.යු උපාලි වසන්ත මැතිතුමා විසින් එම යෝජනා කළ නම් ස්ථිර කරන බව සභාවට දැනුම් දෙන ලදි. ගරු සභාපතිතුමා විසින් විරෝධතා පවති නම් සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි. විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණි. ඒ අනුව මූල්‍ය හා ප්‍රතිපත්ති කාරක සභාවට ඉදිරිපත් කළ නම් සභා සම්මත විය.

**02. නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව**

නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව සඳහා සාමාජික මණ්ඩලය සුදුසු බවට ගරු මන්ත්‍රී කේ.ආර්.එම්. අමරවංශ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. ධර්මදාස බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදින්, නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව පහත සඳහන් පරිදි වේ.

01. ගරු උප සභාපති පී.කේ අසංක ඉඳුනිල් මැතිතුමා - සභාපති
02. ගරු මන්ත්‍රීණි එල් එච් හර්ෂණි මධුමාලි මැතිතුමිය - සාමාජික
03. ගරු මන්ත්‍රී ජී.එම් සුනිල් ප්‍රේමරත්න මැතිතුමා - සාමාජික
04. ගරු මන්ත්‍රී ටි.ඩබ්.යු.උපාලි වසන්ත මැතිතුමා - සාමාජික
05. ගරු මන්ත්‍රී එච්. එම් මහේෂ් ඉන්දික - සාමාජික
06. ඩී.එම්.එස් රංජන් මහතා - සාමාජික
07. ඩී .එම් සිරිවර්ධන මහතා - සාමාජික

ගරු සභාපතිතුමා විසින් විරෝධතා පවති නම් සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි. විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණි. ඒ අනුව නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කළ නම් සභා සම්මත විය.

**03.පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාව**

පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාව සඳහා සාමාජික මණ්ඩලය සුදුසු බවට ගරු මන්ත්‍රී ආර්.එම් අජිත් කුමාර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ජී.එම් සුනිල් ප්‍රේමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදින්, පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාව පහත සඳහන් පරිදි වේ.

01. ගරු මන්ත්‍රීණි ජේ.ශානිකා ප්‍රියදර්ශනි මැතිතුමිය - සභාපති
02. ගරු මන්ත්‍රී බී.බී සිරිත් ප්‍රියදර්ශන මැතිතුමා - සාමාජික
03. ගරු මන්ත්‍රී කේ.එම් අජිත් පුෂ්පනන්දන මැතිතුමා - සාමාජික
04. ගරු මන්ත්‍රීණි ආර්.එම් ඉන්ද්‍රාවති මැතිතුමිය - සාමාජික
05. ගරු මන්ත්‍රීණි ආර්.එම් හේමලතා මැණිකේ මැතිතුමිය- සාමාජික
06. කේ.එම් ගුණසේකර මහතා - සාමාජික
07. ඩබ්.ඩී ප්‍රියා සුරිය සේන මහතා - සාමාජික

ගරු සභාපතිතුමා විසින් විරෝධතා පවති නම් සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි. විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණි. ඒ අනුව පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කළ නම් සභා සම්මත විය.

**04. කාර්මික සේවා පිළිබඳ කාරක සභාව**

කාර්මික සේවා කාරක සභාව සඳහා සාමාජික මණ්ඩලය සුදුසු බවට ගරු මන්ත්‍රී කේ.එම්. ධර්මදාස බණ්ඩාර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිණී එල්.එච්. හර්ෂණී මධුමාලි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදින්, කාර්මික සේවා පිළිබඳ කාරක සභාව පහත සඳහන් පරිදි වේ.

01. ගරු මන්ත්‍රී කේ.ආර්.එම් අමරවංශ මැතිතමා - සභාපති
02. ගරු මන්ත්‍රී ආර්.එම්. අජිත් කුමාර මැතිතුමා - සාමාජික
03. ගරු මන්ත්‍රී ඩී.එම්. කමල් ගුණරත්න මැතිතුමා - සාමාජික
04. ගරු මන්ත්‍රි එල්.ඩබ්.එල් සුජිත් කුමාර මැතිතුමා - සාමාජික
05. පී.එම්. නන්දසේන මැතිතුමා - සාමාජික
06. කේ.එම්. විජිත නන්ද බංඩාර මහතා - සාමාජික
07. එච්.එම්.ආනන්ද ධර්මසේකර මහතා - සාමාජික

ගරු සභාපතිතුමා විසින් විරෝධතා පවති නම් සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි. විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණි. ඒ අනුව කාර්මික සේවා පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කළ නම් සභා සම්මත විය.

න්‍යායපත්‍රානුකූලව මිලඟට එළඹියේ ගරු මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් තමා මෙම සභාවට පත්කර එවීම සම්බන්ධව අදහස් දැක්වීමේ අවස්ථාවයි.

<u>ගරු ටී.ඩබ්.උපාලි වසන්ත කුමාර මැතිතුමා</u>

පළමුව සියලු දෙනා පිළිගත් අතර තමා මෙම ධුරයට පත් කර එවිම සම්බන්ධව සියලු ප්‍රාදේශවාසින්ට ස්තුතිය පුද කරන ලදි. එලෙසම රජයේ ප්‍රතිපත්ති වලට අනුගතව අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනිම සඳහා සියලු දෙනා සමඟ සමුහිකව කටයුතු කරන බව පවසන ලදි.

<u>ගරු ආර්.එම්.ඉන්දාවති මැතිතුමිය</u>

පළමුව සියලු දෙනා පිළිගත් අතර තමා මෙම ධුරයට පත් කර එවිම සම්බන්ධයෙන් එලෙස ජන්දය ලබාදුන් සියලු දෙනාට ස්තුතිය පුදකරන ලදි. තමා සර්ව ජන බලයෙන් කණ්ඩායම් නායක ලෙස ඉදිරිපත් වී මෙලෙස පත්විමට හැකිවිම පිළිබඳ සතුටු වන බවත් තමාට කළහැකි උපරිමයෙන් ජනතාව වෙනුවෙන් කටයුතු කිරිමට පියවර ගන්නා බව පැවසු අතර සභාව විසින් ගන්නා ඕනෑම නිවැරදි තිරණ වෙනුවෙන් සහාය ලබාදෙන බව පවසන ලදි.

<u>එච්.එම් මහේෂ් ඉන්දික බණ්ඩාර මැතිතුමා</u>

පැමිණ සිටි සියලු දෙනා පළමුව පිළිගන්නා ලද අතර තමාට මෙම ධුරය ලබා දිම සම්බන්ධයෙන් කැපවී කටයුතු කල සියලුම ප්‍රදේශවාසින්ට ස්තුතිය පුදකරන ලදී. එලෙසම සියඹලාණ්ඩුව කොට්ඨාශයේ ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් සැමවිටම කටයුතු කරන බවද පවසන ලදී. තමා විරුද්ධ පක්ෂයේ කෙනෙකු වුවත් ජනතාව වෙනුවෙන් සිදු කරන සියලුම යහපත් කටයුතු වලදී පූර්ණ සහයෝගය ලබා දෙන බවත් එකඟවිමට නොහැකි තීන්දු තිරණවලදි ඊට විරුද්ධව හඬ නඟන බවත් පවසන ලදී.

<u>කේ.එම් අමරවංශ මැතිතුමා</u>

පළමුව පැමිණ සිටි පිරිස පිළිගන්නා ලදි. අද දින මාව මෙම ධුරය සඳහා ලියන්ගොල්ල කොට්ඨාශයෙන් පත්කර එවු සියලුම හිතවත් ප්‍රදේශවාසින්ට ස්තුතිය හා ගෞරවය පුදකරන අතර තමා පත්කර එවිමෙන් ජනතාව බලාපොරොත්තු වූ අපේක්ෂාවන් ඉටු කිරිම සඳහා හැමවිටම කටයුතු කරන බව පවසන ලදි. එලෙසම පක්ෂ විපක්ෂ සියලු දෙනා සමඟ ඉතා සහයෝගයෙන් "පොහොසත් රටක් ලස්සන ජිවිතයක් " යන තේමාව අරමුණ කර ගනිමින් කටයුතු කිරිම අපගේ පූර්ණ වගකිමකී. දැනට ආයතනයේ පවතින මුල්‍ය තත්වය අවධානයට ගනිමින් මනා කළමනාකාරිත්වයකින් යුතුව ඉදිරි වැඩසටහන් සැලසුම් කර ජනතා හිතවාදි අයුරින් පවත්වාගෙන යාමට කටයුතු කිරිමටත්, ඉදිරි වසර හතර කාලය අවසන් වන විට

මොනරාගල දිස්ත්‍රික්කයේ ආදර්ශමත් ප්‍රාදේශිය සභාව ලෙස සියඹලාණ්ඩුව ප්‍රාදේශිය සභාව ඉදිරියට ගෙන ඒම අප කාගෙත් වගකිම බව මතක් කරන ලදි. එලෙසම දැනට පවතින තැනින් ඉහල තලයකට මෙම කොට්ඨාශයේ ජනතාව ඔසවා තැබිම පක්ෂ විපක්ෂ අප කාගෙත් වගකිමක් බවද සඳහන් කරන ලදි.

**<u>ආර්.එම් අබේපාල මැතිතුමා</u>**

පැමිණ සිටි සියලු දෙනා ගෞරවයෙන් පිළිගන්නා ලද අතර ඔහුගේ පළපුරුද්ද හා ජේෂ්ඨත්වයද අත්දැකිම්ද පිළිබඳ පැහැදිලි කරන ලදි. එලෙසම තමාට ඡන්ද කොට්ඨාශයට කළ සේවය අගය කිරිමක් වශයෙන් මෙවරද පත්කර එවා ඇතැයි සඳහන් කරන ලදී. විශේෂයෙන්ම මෙම ආයතනයේ රාජකාරි කිරිමේදී නිලධාරින් හා සමස්ථ කාර්ය මණ්ඩලය ආරක්ෂා කර ගනිමින් ඔවුන්ට පීඩනයක් ඇති නොවන පරිදි සුහදව සාකච්ඡා කර සහයෝගයෙන් කටයුතු කිරිමට අප මැදිහත් වියයුතු බව පවසන ලදී. සභා රැස්විම පැවැත්විමට සම්බන්ධව මොහු පවසා සිටියේ නිශ්චිත දිනයක් මේ සඳහා යොදා ගැනිම තුලින් පහසුවෙන් ඒ සඳහා සහභාගි වී කටයුතු කිරිමට හැකි බවයි.

**<u>ගරු එල්.එල්. සුජිත් කුමාර මැතිතුමා</u>**

පළමුව සියලු දෙනා පිළිගන්නා ලදී. තමා පත්කර එවූ එක්සත් ජාතික පක්ෂයේ සහෝදර ජනතාවට ස්තුතිය පුදකර සිටි අතර තමා කෙරේ තැබූ විශ්වාසය වෙනත් පාර්ශවයන් සිදුකල දේශපාලන තත්වයන් මත මෙම පක්ෂයෙන් තමාට ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දිම පිළිබඳව ස්තුතිය පුදකරන ලදි . මෙම කලාපයේ සංවර්ධන කටයුතු පිළිබඳ අවධානය යොමු කිරිමේදි කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපාරය පවතින වටිනාකම අවබෝධ කරගෙන කඩිනමින් ඒ සඳහා ප්‍රවේශ වන ලෙසයි. තවද තමා විපක්ෂයේ කෙනෙකු වුවත් සැම විටම නිවැරදි හා සාධාරණ තිරණ වෙනුවෙන් පෙනි සිටින බවද පවසන ලදි.

**<u>ගරු. ජේ. ශානිකා ප්‍රියදර්ශනි මැතිතුමිය</u>**

පළමුව සියලු දෙනා ආදරයෙන් පිළිගන්නා අතර තමා ආධුනික සභිකවරියක් වශයෙන් පත්කර එවිමට කැපවූ සියලු දෙනාට ස්තුතිය පුද කරන ලදී. ඒ වගේම සියලු දෙනාගේ අභිවෘද්ධිය වෙනුවෙන් හැම අවස්ථාවක දිම කටයුතු කිරිමට උත්සාහය කරන බව පැවසිය. විශේෂයෙන් සියඹලාණ්ඩුව කොට්ඨාශය රටේ අනෙකුත් ප්‍රදේවල ජනතාව අතර ඉතා පහත් මට්ටමකින් සලකා කටයුතු කරන බවත් ඊට උදාහරණයක් වශයෙන් තමාගේ දරුවා අධ්‍යාපනය ලබන පාසලේ ළමුන්ගේ චාරිකාවක් සංවිධානය කිරිමේදි කොළඹ ප්‍රදේශයේ ඊට සම්බන්ධ අය ඉතා පහත් තත්වයෙන් සහ අඩු සැලකිල්ලකින් කතා කළ බවත් එය මෙම ප්‍රදේශයට කළ අපහාසයක් බවත් සඳහන් කරන ලදි. එලෙසම අපි සැම විටම මෙම කොට්ඨාශය ආදර්ශමත් සහ ඉහළ පිළිගැනීමකට ලක්වන ප්‍රදේශයක් වශයෙන් ගොඩනැංවිමට කටයුතු කරමු, බව පවසන ලදි.

**<u>ගරු .ඩබ්. ඒ පුෂ්පජිත් මධුසංක අමරසිංහ මැතිතුමා</u>**

සියලු දෙනා පළමුව ගෞරවයෙන් පිළිගත් අතර තමා මෙම සභාවට පත්වූ මුල්ම අවස්ථාව මෙය බවත් තමා පත්කර එවූ ජනතාවට ස්තුතිය පුද කර සිටින බවත් ප්‍රකාශ කර සිටින ලදී. විශේෂයෙන් කොටියාගල ප්‍රදේශයේ නියෝජනය කරන තමා එම ප්‍රදේශයේ සිටින ජනතාව වෙනුවෙන් ඔවුන්ගේ ජීවන තත්වය නගා සිටුවිම උදෙසා කටයුතු කිරීම අත්‍යාවශ්‍ය බව පැවසීය. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මෙම ජනතාවට උදව් කිරිම අපගේ වගකිමක් බව පැවසිය. මුල් කාලවලදි කුඩම්මාගේ සැලකිල්ලට ලක්වූ මෙම ප්‍රදේශ අද වන විට එයින් 75% පමණ මීදි අගය කළ යුතු තත්වයකට පත්ව ඇතැයි විශ්වාස කරන බව පැවසිය. අපි සියලු දෙනා එකතු වි ලංකාවේම හොඳම ප්‍රාදේශිය සභාව බවට මෙය පත් කරමු. එලෙසම මා හට හිමි සියලුම වරප්‍රසාද කොට්ඨාශයේ ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් කැප කිරිමට මා පසුබට වන්නේ නෑ. නිවැරදි තීන්දු තිරණවලට සහයෝගය ලබා දෙමින්

ලැබෙන ප්‍රතිපාදන වසම් 48 ටම හිමි වන වැඩ සටහනක් සකස් කර ජනතාවට සේවය කිරිම යුතුකමක් බව පවසන ලදි.

<u>ගරු එල්. එච්. හර්ෂණි මධුමාලි මැතිතුමිය</u>

පළමුව සියලු දෙනා පිළිගන්නා ලදි. තමාට ජන්දය ලබා දුන් සියලුම දෙනාට ස්තුතිය පුදකරන අතර ආධුනික මන්ත්‍රීවරියන් ලෙස සියලු දෙනාගේ සහයෝගයෙන් මෙම කටයුතු කිරීමට පියවර ගැනීම සුදුසු බව පැවසිය. ඒ අනුව "අපි ආදර්ශමත්ව කටයුතු කර අනාගත පරම්පරාවට ආදර්ශයක් ලබා දෙමින් අප පක්ෂයේ මූලික තේමාව ජයග්‍රහණය කිරිම උදෙසා සියලු දෙනා කැප වෙමු." යැයි පවසන ලදි.

පෙ.ව. 10.30 සභාව කල් තබන යෝජනාව ගරු සභාපති ඩබ්. වි. සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමා විසින් සිදු කරන ලද අතර ගරු කේ.එම්. අමරවංශ මැතිතුමා විසින් ස්ථිර කර සභාව කල් තබන ලදි.

පෙ. ව. 10. 45 නැවත සභාව ආරම්භ කිරිමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.ආර්.එම්. අමරවංශ මැතිතුමා විසින් සිදු කරන ලද අතර ගරු මන්ත්‍රී ආර්.එම්. අජිත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කර සභාව ආරම්භ කරන ලදි.

<u>ගරු බි.බි සිරිත් ප්‍රියදර්ශන මැතිතුමා</u>

පළමුව සියලු දෙනා පිළිගන්නා ලදි. පත්කර එවූ ජනතාවට ගෞරවනීය ස්තුතිය පුද කළ අතර කොට්ඨාශයේ ජනතාව දුප්පත් කමින් මුදවා ගැනිම අප සියලු දෙනාගේ මූලික වගකිමක් බැවින් මෙතැන් සිට ඒ සඳහා කැප වෙමු. යන්න පවසන ලදි. මෙම කොට්ඨාශය වෙත විවිධ කාර්යන් සඳහා විවිධ පාර්ශවයන් විසින් ලබා දෙන මුදල් ප්‍රමාණය සැලකිල්ලට ගැනිමේදි අපේක්ෂිත ඉලක්ක වලට ලගා විමට නොහැකි වී ඇති බව පවසන ලදි. එසේ වන්නට ඇත්තේ නිසි සැලකිල්ලකින් තොරව කටයුතු කිරිමත් යම් යම් මට්ටම්වලින් එම මුදල් අවභාවිතා කිරිමක් වියහැකි බව පවසන ලදි. "නිසි ලෙස මෙම මුදල් යොදවා යටිතල පහසුකම් හෝ ගොඩනැගුවේ නම් මිට වඩා සුන්දර ජීවිතයක් ජනතාවට ලබා දිමට හැකි බව පවසන ලදි. මාර්ග, ජලය, විදුලිය නිසි ලෙස හදාගෙන ඉදිරියට යාමට අපි උත්සාහ ගනිමු." යැයි පවසන ලදි.

<u>ගරු ආර්. එම් අජිත් කුමාර මැතිතුමා</u>

පළමුව සියලු දෙනා පිළිගනිමින් කියාසිටියේ තමා කොඩයාන කොට්ඨාශයෙන් මෙම ප්‍රාදේශිය සභාවට පත් කර එවිම පිළිබඳව ඒ සඳහා මැදිහත්වූ සියලු දෙනාට ස්තුතිය පල කරන බවයි. එලෙසම අද දින කර තිබූ සංග්‍රහ කටයුතුවලදි ආයතනික කාර්ය මණ්ඩලය දැක්වූ සහයෝගය පිළිබඳව ස්තුතිය පුදකර සිටින ලදි. ඉදිරියේදි එකමුතුව සහයෝගයෙන් කටයුතු කිරිමට අප සියලු දෙනා උත්සාහ ගනිමු යැයි ප්‍රකාශ කර සිටියා.

<u>ගරු ඩී.එම් මධුරාණි දිසානායක මැතිතුමිය</u>

පළමුව පැමිණ සිටි සියලු දෙනා පිළිගත් අතර තමා මෙම ධුරයට පත් කිරිම සම්බන්ධයෙන් ඊට සම්බන්ධ සියලු දෙනාට ස්තුතිය පුද කර සිටින ලදි. ප්‍රධාන වශයෙන්ම දන්වා සිටියේ කොට්ඨාශය තුල පිහිටි පාරවල් බොහෝමයක පසුගිය වර්ෂා සමය තුලදි දැඩිලෙස අබලන් වි ගමනාගමනයට බාධා තත්වයන්ට පැමිණ ඇති බවයි. එම සියලු පාරවල් කඩිනමින් කපා පිළිසකර කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු ආර්.එම් හේමලතා මැණිකේ මැතිතුමිය

පළමුව සියලු දෙනා ගෞරවයෙන් පිළිගන්නා ලදි. ඇය ප්‍රදේශවාසි ජනතාවට තමා පත්කර එවීම සම්බන්ධයෙන් ස්තුතිය පළකර සිටි අතර “පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලු දෙනා එකතු වී ප්‍රදේශයේ දියුණුවට වැඩ කිරීමට අරමුණු කරගමු” වශයෙන් පවසන ලදි .

ගරු කේ.එම් වසන්ත රංජිත් මැතිතුමා

පැමිණ සිටින සියලු දෙනාම පළමුව පිළිගනිමින් ඔහු ප්‍රකාශ කර සිටියේ අතිතයේ සිට මේ දක්වා ඵලදායික ලෙස සිදු කර ඇති කටයුතු සම්බන්ධයෙන් ඒ හා සම්බන්ධ වු සියලු දෙනාටම ස්තුතිය පුද කරන ලදි. මෙම කොට්ඨාශය කෘෂි කාර්මික ප්‍රදේශයක් ලෙස හැදින්විය හැකි බවත්, ප්‍රධාන වශයෙන් උක් වගාව හා වී වගාව බහුල වශයෙන් කරන ජනතාවට එම භෝග බාධාවකින් තොරව ප්‍රවාහනය කර ගැනිම පිණිස කෘෂි මාර්ග සියල්ල සකස් කර දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි. දැනට පවතින බර වාහන යන්ත්‍රෝපකරණවල දෝෂ පවති නම් අලුතින් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක් ලබාගෙන හෝ එම පාරවල් ප්‍රතිසංස්කරණය කර දිම කාලෝචිත ක්‍රියාවක් බව පෙන්වා දෙන ලද එලෙසම තමාට ජන්දය දී මෙම සභාවට පත්කර එවු සියලු පුරවැසියන්ට ස්තුතිය පුද කර සිටින ලදි.

ගරු ඩී.එම් කමල් ගුණරත්න දිසානායක මැතිතුමා

පළමුව සියලු දෙනා ගෞරවයෙන් පිළිගන්නා ලදි .ඉන් අනතුරුව ප්‍රකාශ කර සිටියේ පසු ගිය කාලයේ දේශපාලන පක්ෂ කිහිපයක් තමා නියෝජනය කළ බවත් එම පක්ෂ වලින් සිදු වූ යම් යම් අකටයුතුකම් හේතුවෙන් තමා මෙම පක්ෂය තෝරා ගත් බවත්, තමාට ජනතාවගේ තිබෙන ප්‍රසාදය කිසිදු අයුරින් අඩු වී නොමැති බවත් ,ඒ අනුව මෙවර තමාට මෙම සභාවට පත්කර එවීමට ජනතාව කටයුතු කළ බවත්, පවසන ලදි. ඒ සියලු දෙනාටම ස්තුතිය පුද කරන ලදි. මීට පෙර තමා නියෝජනය කළ පක්ෂ වලින් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වූ කටයුතු වලදී අපේක්ෂිත ප්‍රතිඵල නොලැබූ නිසාද දැන් හොද ගමනක් යාමට හැකි බව පවසන ලදි. ඒ අනුව අපි සියලු දෙනාම එකතු වී එම ගමන සාර්ථකව යාමට උත්සාහ කරමු ”යන්න පවසන ලදි .

ගරු කේ .එම් .ධර්මදාස බණ්ඩාර මැතිතුමා

සියලු දෙනා ගෞරවයෙන් පිළිගත් ගරු මන්ත්‍රිවරයා අද පවතින මෙම ප්‍රදේශයේ තත්වය පිළිබද පැහැදිලි කිරීමක් කරන ලදි. “80,000 පමණ ජීවත් වන ජනතාවගේ කදුල හා සිනහව රදා පවතින්නේ අප සිදු කරන ක්‍රියාකාරකම් මත බව පෙන්වා දෙන ලදි . ප්‍රදේශයට පැමිණෙන පිටස්තර ඕනෑම කෙනෙක් සියඹලාණ්ඩුව දියුණු නගරයක් ලෙස සංවර්ධනය වී ඇති බවට උපකල්පනය කලත්, අපිට සිටින ප්‍රජාව ඉතා අසරණ තත්වයකයි, පසු වන්නේ ඒ සියලු දෙනාට සිනහව රැගෙන ඒම සදහා පවතින අඩු පාඩු හදා ගනිමින් හොද ගමනක් යාමට කටයුතු කලයුතු බව පවසන ලදි. දැනට අපව වට්ටලා ඉන්න තැනින් උඩට එන්න නිරන්තරව උත්සාහ කරමු. අස්වැසුම ඉල්ලන්නේ ඔවුන්ගේ ජීවන තත්වය යම් තරමකින් හෝ දියුණු කර ගනිමින් ඉදිරි ගමනක් යාමටයි. මෙම ප්‍රදේශය ගැන කොළඹ වැනි පිටස්තර පාර්ශවයන් හිතා ගෙන ඉන්නේ ගෙවල්වල දරුවන් බලා ගැනීමට හා වැඩකාරකම්වලට මිනිසුන් සපයන ප්‍රදේශයක් ලෙසයි. මෙම තත්වය අප වෙනස් කලයුතුව ඇත. අපි එකිනෙකාට විවේචනය නොකර දැනට සිටින 21 දෙනාම එක ගමනක් යාමට පියවර ගනිමු” යන්න පවසන ලදි .

ගරු ආර්. එම්.අජිත් කුමාර මැතිතුමා

සියලුම දෙනා ගෞරවයෙන් පිළිගත් අතර තමා වෙනුවෙන් දුන් සියලුම දෙනාට ස්තුතිය පුදකර සිටින ලදි. අදින් ඇරඹෙන මෙම සභාවේ වැඩ කටයුතු සාර්ථකව ඉදිරියට කරගෙන යාම සඳහා සියලු දෙනා එකමුතුව වැඩ කිරිමට පියවර ගනිමු යන්න පවසන ලදි.

ගරු පී.එම් සුනිල් ප්‍රේමරත්න මැතිතුමා

පල්ලේවෙල කොට්ඨාශය වෙනුවෙන් තමා පත් කළ සියලු දෙනාට ස්තුතිය පුද කළ අතර ඊට ප්‍රථම සියලු දෙනා ගෞරවයෙන් පිළිගන්නා ලදි. සියලු දෙනාට තම වගකිම් හා කාර්යන් සාර්ථකව ඉටු කිරිමට සුභාශිංශන පිරිනමමින් එකමුතුව ගමනක් යමු යන්න ප්‍රකාශ කරන ලදී.

ගරු එම්.ඒ චාන්දන බණ්ඩාර මැතිතුමා

පළමු සිටින සියලු දෙනා ගෞරවයෙන් පිළිගන්නා අතර තමාව පොදු ජන එක්සත් පෙරමුණෙන් පුටුව සළකුණෙන් තෝරා පත් කර ගත් සියලු දෙනාට ස්තුතිය පළකරන ලදි. තමා පත්වී සිටින්නේ දෙවන වර බවත්, ඒ අනුව යම් අත්දැකිමක් ඇති බවත් පවසන ලදී. මෙතෙක් කලක් බුද්දම ප්‍රදේශයෙන් මෙවැනි තනතුරකට කෙනෙකු පත් වී නැති බවත් ගරු සභා පතිතුමා කුමන පක්ෂයක් නියෝජනය කරමින් හෝ බුද්දම ප්‍රදේශයෙන් ඉදිරිපත් විමද ආඩම්බරයට කරුණක් බව පවසන ලදී. අප ප්‍රදේශය දරිද්‍රතාවයෙන් පෙළෙන බහුතරයක් ජනතාව ඉන් මුදවා ගැනිමට කටයුතු කිරිම අපගේ වගකිමක් බව පවසන ලදී. එලෙසම සියඹලාණ්ඩුව සෝසුසුම් නොහෙළන ජනතාවක් වෙනුවෙන් ඉහළ ජීවන තලයකට ගෙන ඒමට හැකි සෑම විටම සහය ලබා දෙන බව පවසන ලදී. තවද කොට්ඨාශයේ ජනතාවට ණය නැති කෙනෙක් වෙමු .සියඹලාණ්ඩුවේ පැතිර යන මත් ද්‍රව්‍ය උවදුර නැති කිරිමට කටයුතු කරමු . තරුණ ශ්‍රමය කාලය අරමුණුගත ඉලක්ක වෙත යොමු කර කොට්ඨාශයේ හොඳ ව්‍යවසායකයින් බිහි කිරිමට මැදිහත් වන ලෙස කාරුණිකව ඉල්ලා සිටින බව පවසන ලදී.

ගරු පී.කේ අසංක ඉඳුනිල් මැතිතුමා.

පළමුව පැමිණ සිටින සියලු දෙනා ගෞරවයෙන් පිළිගත් අතර තම පක්ෂය වෙනුවෙන් ජන්දය දිපු හා නොදිපු සියලු පුරවැසියන්ට ස්තුතිය පුද කරන ලදී. දැන් අප කොට්ඨාශයේ සමස්ත ජනතාවටම පක්ෂ පාට භේදයකින් තොරව වැඩ කිරිමට මැදිහත් විය යුතු බව පැවසිය . ''මිට ප්‍රථම තම අදහස් ඉදිරිපත් කළ සියලු දෙනාටම ගෞරවය පුද කරන ලදි. නිවැරදි යෝජනා ලබා ගනිමින් උසස් තලයට ජනතාව රැගෙන යාමටත් , උසස් මානව පිරිසක් බිහි කිරිමටත්, කැප විම වගකිමක් ලෙසින් සලකා කටයුතු කරන බවටත් පවසන ලදී. මින් ඉදිරියට ප්‍රදේශවාදින් නොවි කටයුතු කරමු අප දැන් අලුත් ගමනක් යාමට මුලපුරා ඇති බවත්, එම ගමන යාමේදි යම් යම් වැරදි සිදු විය හැකි බවත් ,එම වැරදි තවත් වැරදිවලින් වසන්නේ නැතුව නිවැරදි කර ගෙන අප සියලු දෙනා සාර්ථක ගමනක් යමු.'' බවට පවසන ලදී. අපිත් , නිළධාරි පාර්ශවයත්, පුරවැසි ප්‍රජාවත් එකට එකතු වී මේ පොදු අරමුණ වෙනුවෙන් ක්‍රියාත්මක වෙමු. එසේ සාර්ථක ගමනක් යමින් ඉදිරි දිනක "ආදර්ශමත් ප්‍රාදේශිය සභාව බවට මෙම ප්‍රාදේශිය සභාව පත් කිරිමට පියවර ගනිමු" යනුවෙන් පවසන ලදී .

ගරු සභාපති ඩබ්. වී සුසන්ත ප්‍රදිප් කුමාර මැතිතුමා

''අද දින මෙම ස්ථානයට පැමිණි සිටින සභිකවරුන් සහ නිලධාරින්, මාධ්‍යවේදින් හා අනෙකුත් සියලු දෙනාට ස්තුතිය පළ කරන ලදී. කථාකල සියලු දෙනාම සාධනිය අදහස් ඉදිරිපත් කිරිම පිළිබඳව සතුටු වෙනවා. දැන් අපි සියලු දෙනාම එකම කණ්ඩායමක් බැවින් කවුරුත් එකාවන්ව කටයුතු කිරිමට මැදිහත් වෙමු. ජනතා අභිලාෂයන් අපේ කර මතයි වැටිලා තියෙන්නේ. ඉදිරිය හා අතීතය ගැන හොඳ නිරික්ෂණයක් අපට තියෙනවා. අප අවබෝධ කරගත් දෙයක් තියෙනවා. ජනතා ප්‍රශ්න දේශපාලන

අවශ්‍යතා වෙනුවෙන් සම්බන්ධ නොකර අපි හරිමගට නිශ්චිත අරමුණ වෙනුවෙන් මැදිහත් වෙමු. අපට යන්න තියන ගමන ඉතා දුෂ්කරයී හා ඇතයි. අප නිවැරදි අරමුණ වෙනුවෙන් අපගේ කාලය කැප කිරිමට මැදිහත් වෙමු. අවබෝධයෙන් තිරණ ගනිමු. සියඹලාණ්ඩුව කොට්ඨාශය තුල දුප්පත්කම දැන් පැළ වෙලා. එය නැති කිරිම අපගේ පරම වගකිමයි. අපගේ සම්පත් නිවැරදිව භාවිතා කරමු. ජනතාව වෙනුවෙන් තිරණ ගැනිමේදී පක්ෂය එළියෙන් තබා සාමුහිකව තිරණ ගනිමු. සියලු දෙනා නිවැරදි හරි පාරේ යමු. එය ජනතාවගේ අරමුණ ඉටු කරන පාර විය යුතුයි. ආයතනයේ කාර්ය මණ්ඩය සමඟ සාමුහිකව මේ ගමන යන්න මැදිහත් වෙමු. ජනතාවගේ සුව පහසුව වෙනුවෙන් අප අපගේ අරමුණ හා ශක්තිය මෙහෙයවමු. අපි ජනතාව වෙනුවෙන් නිරන්තරව කැප වී කටයුතු කරමු. විවිධ කුසලතා ඇති අය දැන් අප අතර ඉන්නවා. ඒ ජනතා මෙහෙවර වෙනුවෙන් යොදා ගැනිමට සැම විටම උත්සාහ ගනිමු. එලෙසම සියලු දෙනා එකතු වී සාමුහිකව තිරණගෙන අපේ ආයතනය හොදම ප්‍රාදේශිය සභාව බවට පත් කිරිමට දැඩි ලෙස අධිෂ්ඨාන කරගමු'' යනුවෙන් පවසන ලදී.

එලෙසම මීට පෙර කතාකළ සියලුම මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා දන්වන ලද අදහස් පිළිබඳ සංක්ෂිප්තව ගරු සභාපතිතුමා විසින් අදහස් ඉදිරිපත් කිරිමක් සිදු කරන ලදී. මේ අනුව අද දිනට යෙදි තිබු න්‍යායපත්‍රයට පරිදි සියලු කටයුතු අවසන්විම මත විශේෂ මහා සභාවේ වැඩ කටයුතු ප.ව 12.45 පමණ අවසන් කරන ලදී. අද දින සාකාච්ජා කර ඒකමතිකව අනුමත කරගත් පරිදි ඊළග මහා සභාව 2025.06 27 දින පෙ.ව. 9.00 ට පැවැත්විමට තිරණය කරන ලදී.

ඩබ්.වී සුසන්ත ප්‍රදිප් කුමාර,
සභාපති,
සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව.